PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்
විශ්වාසයේ ප්‍රමුඛයා

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

(මහජන බැංකුවට අනුබද්ධිතය)

ෆිච් රේටිංස් ලංකා වෙතින් A+(lka) වර්ගීකරණය.

2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
දේසිය කණක්කාය්වු අලුවලකම්
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / එනතු இல. / My No. BAF/D/PLF/2021/01 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 07 June 2021

සභාපති
පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2021 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2021 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්, 2021 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) සහ පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. මෙම විගණනය කර ගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ ක්‍රියාත්මක වන වරලත් ගණකාධිකාරී ආයතනයක් මා වෙත සහය විය.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2021 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සාධාරණ දැක්මක් ලබා දේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි.

ප්‍රධාන විගණන කරුණු	මූලික විගණන කරුණු මාගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායන වෙන්කිරීම් 2021 මාර්තු මස 31 වන දිනට, සමූහයේ මුළු වත්කම් වලින් 82% වූ රු. මිලියන 149,342ක් වූ ණය සහ ලැබීම් වලින් සමන්විත විය. (සටහන 25) රු. මිලියන 9,882ක් වූ ශුද්ධ අපහායන වෙන්කිරීම් (සටහන 25). සටහන 25.7 හි විස්තර කර ඇති පරිදි, මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ ඇති අපහායන වෙන්කිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 අනුකූල වේ. ප්‍රධාන විගණන කාර්යයන් වූයේ:: • අපහායන වෙන්කිරීම් ප්‍රමාණාත්මකතාවය පැතුරුම් පත් (Spread Sheet) භාවිතයෙන් ගණනය කිරීම • ගණනය කිරීම් හා සම්බන්ධ උපකල්පන, අවිනිශ්චතා සහ තක්සේරු කිරීම අපහායන වෙන්කිරීම් තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරනු ලබන සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවල ප්‍රධාන අංශ පහත දැක්වේ: • COVID-I9 සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි ඇති විය හැකි බලපෑම් (උදා: රජයේ දිරි දීමනා සහ සමූහය විසින් ලබා දී ඇති ණය තාවකාලික සහන පියවර); • පුළුල් පරාසයක විභව ආර්ථික ප්‍රතිඵල සහ අනාගත අපේක්ෂිත ණය පාඩු කෙරෙහි COVID-19 වෙතින් ඇති විය හැකි බලපෑම් සැලකිල්ලට ගෙන සාර්ව ආර්ථික තත්ත්වයන් සංවර්ධනය කිරීම හා ඒකාබද්ධ කිරීම ඇතුළුව ඉදිරි දැක්ම	මාගේ වාර්තාවේ දිනය දක්වා පැවති තොරතුරු මත පදනම්ව COVID 19 බලපෑම් සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයෙහි ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් අදාල ක්‍රමවේදය තුලින් SLFRS 9 හි අවශ්‍යතා සමඟ සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් මම තක්සේරු කළෙමි. විගණන ක්‍රියා පටිපාටි පහත සඳහන් දෑ අතර වේ: • ණය සහ ලැබිය යුතු දේ පිළිබඳ අපහායනය තක්සේරු කිරීම සම්බන්ධ පාලනයේ සැලසුම් ඵලදායිත්වය මම ඇගයීමට ලක්කල අතර එයට සැලකියයුතු විනිශ්චයන් පිළිබඳ පාලනය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ කළමනාකරණය විසින් හානිකරණයට අදාළව තක්සේරු සහ උපකල්පන ඇතුළත් විය. • ගණනය කිරීම සඳහා භාවිතා කල දත්ත, ප්‍රභව ලේඛන සහ ගිණුම්කරණ වාර්තාවන් හි සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය මම පරීක්ෂා කළෙමි. • පාදක වූ ගණනය කිරීම පරීක්ෂා කළෙමි. • ඉහත සඳහන් කරුණුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාපටිපාටි ද ඉටුකරන ලදී. නියැදියක් ලෙස අපහායනය සඳහා තනි තනිව තක්සේරු කළ ණය සහ ලැබිය යුතු පිළිබඳ: – අපහායනය සිදු වී තිබේද යන්න තීරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කළ ප්‍රධාන නිර්ණායක තක්සේරු කිරීම. සහ – අපහායන දර්ශක පවතින අවස්ථාවලදී, නියැදි පදනමත් මත රජයේ සහන ක්‍රියාමාර්ග, වට්ටම් අනුපාත සහ දරන ලද ඇපවල වටිනාකම සලකා බලමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ඇතුළුව කළමනාකරණයේ ඇස්තමේන්තුගත අනාගත අයකිරීම්වල සාධාරණත්වය මම ඇගයීමට ලක්කළෙමි. අපහායනය සඳහා සාමූහිකව තක්සේරු කළ ණය සහ ලැබිය යුතු දේ සඳහා: – අනාගත දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සන්සන්දනය කරමින් කළමනාකරණයේ විචේචනාත්මක ආවරණ තුළ ඔවුන් විසින් භාවිතා කළ සාධාරණ උපකල්පන සහ ඇස්තමේන්තු සහ අනෙකුත් සාධක, – COVID-19 වසංගතයේ ඇති විය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින් ආවරණ තීරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කරන පදනම සහ දත්ත තක්සේරු කිරීම. • සටහන් 11 සහ 25 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණවල ප්‍රමාණාත්මකභාවය මම ඇගයීමට ලක්කළෙමි.

ප්‍රධාන විගණන කරුණු	මූලික විගණන කරුණු අපගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය
මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ පාලනයන් සමූහය සිය මෙහෙයුම් වලදී බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධති භාවිතා කරයි. ප්‍රධාන විගණන කාරණයක් ලෙස මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ පාලනයන් පහත පරිදි මම තෝරා ගත්තෙමි: • සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය එහි තොරතුරු තාක්ෂණ පද්ධති වලින් ලබාගත් තොරතුරු මත දැඩි ලෙස රඳා පවතී. සහ • බහුවිධ පද්ධති භාවිතය තුලින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම් - ජනනය කරන ලද වාර්තා සහ ගණනය කිරීම් • දුරස්ථ ප්‍රවේශය තුලින් වෙනස්වන වැඩ පරිසරයක්.	වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය: • දුරස්ථ ප්‍රවේශය වැඩිවීම සැලකිල්ලට ගෙන මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ආරක්ෂක අධීක්ෂණ ක්‍රියා පටිපාටි අවබෝධ කර ගැනීම. • බහුවිධ පද්ධති වාර්තා උත්පාදනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම් සඳහා වැදගත් තොරතුරු ගණනය කිරීමේදී අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ස්වයංක්‍රීය, තොරතුරු තාක්ෂණ මත පදනම් වූ සහ අතින් පාලනය කිරීමේ සැලසුම් සහ මෙහෙයුම් ඵලදායීතාවය අවබෝධ කර ගැනීම සහ ඇගයීම. • නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා සැලකිය යුතු අනාවරණයන් ජනනය කිරීම සඳහා භාවිතා කරන වාර්තා වල ප්‍රභව දත්ත පරීක්ෂා කිරීම; • පොදු ලෙජර ප්‍රතිසන්ධාන ක්‍රියා පටිපාටිවල සාධාරණත්වය තක්සේරු කිරීම, පද්ධති වාර්තා සහ අදාළ දත්ත මූලාශ්‍ර දත්ත වෙත හරස් පරීක්ෂාව ඇතුළත් වේ.

ප්‍රධාන විගණන කරුණු	මූලික විගණන කරුණු අපගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුලින් පොලී ආදයමට ඇති බලපෑම COVID 19 වසංගතයෙන් බලපෑමට ලක්වූ පාරිභෝගිකයින්ට සමූහය විසින් ලබා දෙන ලද ණය සහන සහ වෙනත් සහන ක්‍රියාමාර්ග ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුලින් ණය සහ ලැබිය යුතු දෑ හි පොලී ආදායමට වූ බලපෑම ප්‍රධාන විගණන කරුණක් ලෙස : • එවැනි තාවකාලික අත්හිටුවීම් සහ වෙනත් සහන ක්‍රියාමාර්ග හේතුවෙන් ගනුදෙනුකරුවන් සමඟ සැලකිය යුතු වෙනස් කිරීම් සිදු වී තිබේද නැද්ද යන්න තීරණය කිරීමේදී වැදගත් විනිශ්චයන්. • එම කාල සීමාව සඳහා හඳුනාගෙන ඇති ආදායම මත ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුලින් බලපෑම ගණනය කිරීම සඳහා කළමනාකරණය විසින් පැතිරීම් පත්‍ර (Spread Sheet) පදනම් කරගත් ගණනය කිරීම් භාවිතා කිරීම.	වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය: • ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති සහනකාලය සහ වෙනත් සහන ක්‍රියාමාර්ග ප්‍රදානය කිරීම, වාර්තා කිරීම සහ ගිණුම්කරණය කිරීම සඳහා සමූහය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් මා ලබා ගත්තේය. • ණයසහන සහ වෙනත් සහන ක්‍රියාමාර්ග හේතුවෙන් නියැදි පදනමක් මත ගනුදෙනුකරුවන්ගේ පහසුකම් සඳහා සැලකිය යුතු වෙනස් කිරීම් සිදුවී තිබේද නැද්ද යන්න තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් ගනු ලබන විනිශ්චයන්හි සාධාරණත්වය මම තක්සේරු කළෙමි. පොලී ආදායම් හඳුනා ගැනීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වෙනස් කරන ලද පහසුකම් සඳහා පොලී ආදායම හඳුනාගෙන තිබේද යන්න ඇගයීම මෙයට ඇතුළත් ය. • පැතිරුම් පත්‍රිකා (Spread Sheet) පදනම් කරගත් ගණනය කිරීම්වල නිරවද්‍යතාව මම පරීක්ෂා කළෙමි. නියැදි පදනමක් මත මූලාශ්‍ර ලේඛන සහ තාවකාලික ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිලාභවලට එකඟ වීමෙන් එවැනි පැතිරුම් පත්‍ර (Spread Sheet)පදනම් කරගත් ගණනය කිරීම්වල භාවිතා වන දත්තවල සම්පූර්ණභාවය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම මගේ ක්‍රියා පටිපාටිවලට ඇතුළත් ය.

1.4 සමූහයේ 2021 වාර්ෂික වාර්තාවට ඇතුළත් වෙනත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට (අදාළ වන පරිදි) කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමියි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021 මාර්තු 31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ප්‍රධාන මූල්‍ය දත්ත (විගණනය කල)

රුපියල් මිලියන වලින්	සමාගම		සමූහය	
	වර්තමාන කාල පරිච්ජේදය 2020 අප්‍රේල් 01 සිට 2021 මාර්තු 31	පසු ගිය කාල පරිච්ජේදය 2019 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31	වර්තමාන කාල පරිච්ජේදය 2020 අප්‍රේල් 01 සිට 2021 මාර්තු 31	පසු ගිය කාල පරිච්ජේදය 2019 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31
පොලී ආදායම	24,983	31,459	26,822	33,283
අඩු කලා ඃ පොලී වියදම්	13,064	15,787	13,375	16,111
ශුද්ධ පොලී ආදායම	11,919	15,672	13,447	17,172
වෙළඳ කටයුතු වලින් ලද ලාභය /(අලාභය)	163	11	228	20
වෙනත් ආදායම්	1,958	2,129	6,595	6,752
මෙහෙයුම් වියදම් (ණය අපහායනය හැර)	7,024	8,508	10,988	13,234
ණය අපහායනය	1,143	4,752	1,452	5,007
බදු පෙර ලාභය /(අලාභය)	5,873	4,552	7,830	5,703
ආදායම් බදු	1,840	1,609	2,234	2,111
බදු පසු ලාභය /(අලාභය)	4,033	2,943	5,596	3,592

2021 මාර්තු 31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ප්‍රධාන මූල්‍ය දත්ත (විගණනය කල)

රුපියල් මිලියන වලින්	සමාගම		සමූහය	
	2021 මාර්තු 31 දිනට	2020 මාර්තු 31 දිනට	2021 මාර්තු 31 දිනට	2020 මාර්තු 31 දිනට
වත්කම්				
මුදල් හා බැංකු ශේෂයන්	**8,102**	5,243	12,076	9,220
රජයේ සුරැකුම්පත්	**6,994**	9,236	9,020	11,079
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු	**1,509**	1,618	-	-
ණය (සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ණය හැර)	**139,879**	146,130	149,342	154,135
කොටස් සඳහා ආයෝජන	**3,533**	3,552	334	352
දේපල ආයෝජන	**-**	-	821	1,132
දේපල පිරියත සහ උපකරණ	**3,292**	3,083	5,626	5,638
වෙනත් වත්කම්	**1,237**	2,798	4,072	4,441
මුළු වත්කම්	**164,546**	171,660	181,291	185,997
වගකීම්				
බැංකු සඳහා ගෙවිය යුතු	**6,439**	7,938	9,004	10,978
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු	**3**	-	-	-
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	**101,503**	106,701	103,744	107,686
වෙනත් ණය ගැනීම්	**13,826**	18,479	13,685	18,338
වෙනත් වගකීම්	**8,434**	8,295	13,736	13,685
මුළු වගකීම්	**130,205**	141,413	140,169	150,687
ස්කන්ධය				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**14,892**	13,915	14,892	13,915
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**2,407**	2,205	2,465	2,235
රඳවාගත් ඉපැයුම්	**17,160**	14,228	20,682	16,518
අනෙකුත් සංචිත	**(118)**	(101)	421	285
සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි මුළු ස්කන්ධය	**34,341**	30,247	38,460	32,953
පාලනය කල නොහැකි හිමිකම	**-**	-	2,662	2,357
මුළු ස්කන්ධය	**34,341**	30,247	41,122	35,310
සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	**20.15**	18.58	22.56	20.25

තෝරාගත් කාර්ය සාධන දර්ශකයන්

අයිතම	2021 මාර්තු 31 දිනට		2020 මාර්තු 31 දිනට	
	තථ්‍ය	අවශ්‍ය	තථ්‍ය	අවශ්‍ය
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%)				
1 වන ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	17.04	7	15.12	7
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	17.90	11	15.99	11
අරමුදල් ප්‍රාග්ධනයට තැන්පතු වගකීම් අනුපාතය	33.83	10	28.35	10
ණය කලඹේ ගුණාත්මකතාවය (%)				
දළ අක්‍රිය ණය අනුපාතය		9.21		9.13
ශුද්ධ අක්‍රිය ණය පහසුකම් අනුපාතය		1.92		2.55
ශුද්ධ අක්‍රිය ණයට මූලික ප්‍රාග්ධන අනුපාතය		9.19		13.74
වෙන් කිරීම් ආවරණ අනුපාතය		64.63		60.30
ලාභදායිත්වය (%)				
ශුද්ධ පොලී ආන්තිකය		7.58		9.68
වත්කම් මත ප්‍රතිලාභ		3.49		2.64
හිමිකම මත ප්‍රතිලාභ		12.49		10.00
ආදායම් මත පිරිවැය අනුපාතය		42.03		37.12
ද්‍රවශීලතාවය (%)				
පවතින ද්‍රවශීල වත්කම්වලට ද්‍රවශීල වත්කම් අවශ්‍යතා අනුපාතය (අවම 100%)		194.77		111.51
ද්‍රවශීල වත්කම් වලට බාහිර අරමුදල් අනුපාතය		11.44		10.86
නාමික තොරතුරු				
ශාඛා ගණන		104		103
බාහිර ණය ශ්‍රේණිය		ෆිච් රේටිංස් ලංකා වෙතින් A+(lka) වර්ගීකරණය.		ෆිච් රේටිංස් ලංකා වෙතින් A+(lka) වර්ගීකරණය.

සහතික කිරීම

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමණාකරු - මූල්‍ය සහ අනුකූලතා නිලධාරී වන අප විසින් සමූහිකව පහතින් සහතික කර ඇති පරිදි,

(අ) ඉහත ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආකෘතියට හා අර්ථ දැක්වීම් වලට අනුකූලව සකස් කර ඇත.

(ආ) බලපත්‍රලාභී මූල්‍ය සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු විගණනය කළ තොරතුරු ලෙස සඳහන් නොවන්නේ නම් විගණනය නොකළ තොරතුරු ලෙස සලකනු ලැබේ.

(අ.ක.ල.)
ශමින්ද්‍ර මර්සිලින්
ප්‍රධාන විධායක නිළධාරී
04/06/2021

(අ.ක.ල.)
ඔමල් සුමනසිරි
ප්‍රධාන කළමණාකරු - මූල්‍ය
04/06/2021

(අ.ක.ල.)
සයිරා කලීල්
අනුකූලතා නිළධාරී
04/06/2021

1995 අගෝස්තු 22 වැනි දින සංස්ථාපනය කරන ලදී. 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමකි.

සමාගම් අංකය. PB 647 PQ. නො .1161, මරදාන පාර, කොළඹ 08. තැ.පෙ. : 1346 දුර : 011-2631631 ෆැක්ස් : 011-2631000 www.plc.lk